**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජූලි 2023

## (302) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය

(Management Accounting and Finance)

---

**සමස්ත විග්‍රහය:**

මෙම ප්‍රශ්න පත්‍රය ලකුණු 100ක් ආවරණය කරමින් කොටස් තුනකින් සමන්විත වේ.

1. **A කොටස** ලකුණු 20 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න හතරකින් (1-4) සමන්විතය.
2. **B කොටස** ලකුණු 30 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න තුනකින් (5-7) සමන්විතය.
3. **C කොටස** ලකුණු 50 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න තුනකින් (8-10) සමන්විතය.

**පොදු නිරීක්ෂණ:**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා බහුතරයක් අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය සඳහා හොඳින් පිළිතුරු සපයා තිබුණි.

**කොටස් අනුව කාර්යසාධනය:**

**A කොටසේ** ලකුණු 20 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න හතරක් දී ඇත. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. ප්‍රශ්න අනුව මෙම කොටසේ කාර්ය සාධනය පහත පරිදි වේ:

| ප්‍රශ්න අංකය | කාර්යසාධනය ශ්‍රේණිගත කිරීම |
|---|---|
| 1 | සතුටුදායකයි |
| 2 | සෑහීමකට පත් නොවේ |
| 3 | සෑහීමකට පත් නොවේ |
| 4 | හොඳයි |

**B කොටසේ** ලකුණු 30 සඳහා අනිවාර්ය ප්‍රශ්න තුනක් දී ඇත. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. ප්‍රශ්න අනුව මෙම කොටසේ කාර්යසාධනය පහත පරිදි වේ:

| ප්‍රශ්න අංකය | කාර්යසාධනය ශ්‍රේණිගත කිරීම |
|---|---|
| 5 | හොඳයි |
| 6 | හොඳයි |
| 7 | සතුටුදායකයි |

**C කොටසේ** ලකුණු 50 සඳහා ප්‍රශ්න තුනක් දී ඇත. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපැවතුණි. ප්‍රශ්න අනුව මෙම කොටසේ කාර්ය සාධනය පහත පරිදි වේ:

| ප්‍රශ්න අංකය | කාර්යසාධනය ශ්‍රේණිගත කිරීම |
|---|---|
| 8 | සෑහීමකට පත් නොවේ |
| 9 | සතුටුදායකයි |
| 10 | සතුටුදායකයි |

## A කොටස

## ප්‍රශ්න අංක 01

කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

සතුටුදායකයි.

**පොදු දුර්වලතා;**

(1) සමහර අයදුම්කරුවන් ණය හිමියන්ගේ පියවීම් කාලය නිවැරදිව ගණනය කර නොමැත.

(2) සමහර අයදුම්කරුවන් ආරම්භක සහ අවසාන ශේෂයන් එකතුකර 2න් බෙදීමෙන් සාමාන්‍ය ණය හිමියන්/සාමාන්‍ය තොගය ගණනය කර නොමැත.

(3) බොහෝ අයදුම්කරුවන් ගැනුම් නිවැරදිව ගණනය කර නොමැත. ණය හිමියන්ගේ පියවීම් කාලය නිවැරදිව ගණනය කිරීමට ඔවුන් අපොහොසත් වී ඇති බැවින් කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කිරීම වැරදියට සිදු කර තිබුණි.

(4) සමහර අයදුම්කරුවන් කාරක ප්‍රාග්ධන චක්‍රය ලබා ගැනීමේ දී ණය හිමියන්ගේ පියවීම් කාලය වැරදි ලෙස එකතු කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

අයදුම්කරුවන් පසුගිය ප්‍රශ්න පත්‍ර පුහුණු විය යුතු අතර, ස්ව-අධ්‍යයන කට්ටලයේ ඇති ප්‍රශ්න පුහුණු කළ යුතුය.

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය පොදු කාර්යය අන්තර්ගහණ පිරිවැය ක්‍රමය භාවිත කරමින් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

සෑහීමකට පත් නොවේ.

**පොදු දුර්වලතා;**

(1) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් පොදු කාර්යය අවශෝෂණ අනුපාතය වැරදි ලෙස ගණනය කර තිබුණි. තවද, පොදු කාර්ය සඳහා වන ඌණ අන්තර්ගහණය/අධි අන්තර්ගහණය තේරුම් ගැනීමට අපොහොසත් වීම නිසා ඔවුන්ට ලාභ ප්‍රකාශනය සකස් කිරීමට නොහැකි වී තිබුණි.

(2) ඇතැමුන් ඒකකයක පිරිවැය වැරදි ලෙස ගණනය කර තිබීමේ ප්‍රතිඵලක් වශයෙන් විකුණුම් පිරිවැය වැරදි ලෙස ගණනය කර තිබුණි.

(3) සමහර අයදුම්කරුවන් නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය දළ ලාභයෙන් අඩු කිරීම වෙනුවට, විකුණුම් පිරිවැයට ඇතුළත් කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

අයදුම්කරුවන් පසුගිය ප්‍රශ්න පත්‍රවල මේ හා සමාන ආකාරයේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පුහුණු විය යුතු අතර දැනුම යාවත්කාලීන කිරීම සඳහා අමතර පොත් සහ ස්ව-අධ්‍යයන කට්ටල අධ්‍යයනය කළ යුතුය.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් නම්‍යශීලී අයවැය සකස් කරන්නේ කෙසේද යන්න පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

සෑහීමකට පත් නොවේ.

**පොදු දුර්වලතා;**

(1) මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ බහුතරයකගේ උත්තර පිළිබඳ සතුටුදායක විය හැකිය.

(2) නමුත් සමහර අයදුම්කරුවන් එක් එක් විකුණුම් මට්ටම් සඳහා විචල්‍ය පිරිවැය නිවැරදිව ගණනය කර නොමැත.

(3) සමහර අයදුම්කරුවන් එක් එක් මට්ටම් සඳහා ස්ථාවර පිරිවැය නිවැරදිව ගෙන නොමැත.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

(1) ප්‍රශ්නයට අදාල ගණන් සෑදීමට පෙර එය හොඳින් කියවන්න.

(2) මීට පෙර පරීක්ෂා කර ඇති මේ හා සමාන ප්‍රශ්න පුහුණු වෙන්න.

(3) සියලුම පෙර වැඩ පෙන්විය යුතුය.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය ප්‍රමිත පිරිවැය පිළිබඳ න්‍යායාත්මක දැනුම පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

හොඳයි

**පොදු දුර්වලතා;**

(1) අයදුම්කරුවන් බොහෝ දෙනෙක් මෙම ප්‍රශ්නය සඳහා සපයා තිබූ උත්තර ඉතා හොඳ මට්ටමක විය.

(2) සමහර අයදුම්කරුවන් ඉතා වැදගත් කරුණු සඳහන් කර නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

මීට පෙර පරීක්ෂා කර ඇති මේ හා සමාන ප්‍රශ්නවලට පිළිතුරු සපයා පුහුණු වීමට අමතරව අතිරේක පොත් සහ ස්ව-අධ්‍යයන කට්ටල අධ්‍යයනය කළ යුතුය.

# <u>B කොටස</u>

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය මඟින් මුදල් අයවැයක් පිළියෙල කරන්නේ කෙසේද යන්න පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

හොඳයි

**පොදු දුර්වලතා;**

(1) බෙදාහැරීමේ දිනට, දින 60 කට පෙර මුදල් ලැබීම ඇතුළුව විකුණුම් වලින් මුදල් ගලා ඒම, බොහොමයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව හඳුනාගෙන නොමැත.

(2) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් පොලී ආදායම නිවැරදිව හඳුනා ගැනීමට අපොහොසත් වී ඇත. කෙසේ වෙතත්, සමහර අයදුම්කරුවන් වාර්ෂික පොලී ආදායම 6% භාවිතා කර නිවැරදිව ගණනය කර ඇති නමුත්, ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා මාසික පොලී ආදායම ගණනය කිරීම සඳහා 12 න් බෙදීමට අසමත් වී ඇත.

(3) මාසික අයවැය පිළියෙල කිරීම ප්‍රශ්නයෙන් අසන ලද නමුත්, සමහර අයදුම්කරුවන් කාර්තුමය අයවැය ගණනය කර පෙන්වා ඇත.

(4) සමහර අයදුම්කරුවන් ශුද්ධ මුදල් ප්‍රවාහය සහ අවසාන මුදල් ශේෂයන් ඉදිරිපත් කර නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

පසුගිය ප්‍රශ්න පත්‍ර පුහුණු වන්න. සෑම විභාගයකදීම සමාන ආකාරයේ ප්‍රශ්න නැවත නැවත පරීක්ෂා කර ඇති බැවින්, පසුගිය ප්‍රශ්න පත්‍රවල ඇති ගණන් සාදා පුරුදු වන්න.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය සීමාකාරී සාධකය හඳුනා ගැනීම සහ සීමාකාරී සාධකය මත පදනම්ව නිෂ්පාදන මිශ්‍රණය ගණනය කිරීම පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

හොඳයි

**පොදු දුර්වලතා:**

(1) සමහර අයදුම්කරුවන් ගණනය කිරීම් පමණක් පෙන්වා ඇති නමුත් ගණනය කිරීම් මත පදනම් ව සීමාකාරී සාධකය හඳුනාගෙන නොමැත.

(2) සමහර අයදුම්කරුවන් සීමාකාරී සාධකය සහ ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය සඳහා ගණනය කිරීමේදී ඒකකයකට අදාලව වැරදි kg ප්‍රමාණයක් භාවිතා කර තිබුණි.

(3) සමහරක් සීමාකාරී සාධකයකට අදාල දායකත්වය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(4) සමහරක් ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය ගැන සඳහන් කර නොමැත.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

(1) පසුගිය ප්‍රශ්න පත්‍රවල ඇති ගණන් සාදා පුහුණු වන්න.

(2) සෑම විටම ඔබගේ උත්තරයට අදාල පෙරවැඩ පෙන්වන්න.

(3) ගණනය කිරීමේ දෝෂ වළක්වා ගන්න.

(4) සීමාකාරී සාධකය පිළිබඳ දැනුම වැඩි දියුණු කළ යුතුය.

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය ඡන්ද හිමි සාමාන්‍ය කොටස් පිරිවැය ගණනය කිරීම, නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය, නිදහස් කළ හැකි ණයකර පිරිවැය සහ වෙළෙඳපොළ අගය භාවිතයෙන් බරතැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීම පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

සතුටුදායකයි.

**පොදු දුර්වලතා:**

(1) බොහෝ අයදුම්කරුවන් **(a)** සහ **(b) කොටස්** සඳහා නිවැරදිව පිළිතුරු සපයා ඇතත් **(c)** සහ **(d) කොටස්වල** වැරදි සිදු කර තිබුණි.

(2) බොහෝ අයදුම්කරුවන් කොටස්වල මිල කුමක්දැයි යන්න දැන සිටියේ නොමැත. ඔවුන් උත්තර සපයා තිබුනේ ප්‍රතිශතය වෙනුවට රුපියල් වලින්.

(3) බහුතරයක් වසර 1 සිට 6 අතර කාලය තුළ පොලිය ගණනය කිරීමේදී වැරදි සිදු කර තිබුණි.

(4) සමහරක් අයදුම්කරුවන් ණයකරවල පිරිවැය ගණනය කිරීම සඳහා බදු සලකා නොතිබුණි.

(5) ප්‍රශ්නයේ වර්තමාන වෙළඳපල අගය දක්වා ඇති නමුත්, සමහර අයදුම්කරුවන්ට නිදහස් කළ හැකි ණයකර පිරිවැය / නිදහස් කළ නොහැකි වරණීය කොටස්වල වෙළඳපල වටිනාකම ලබා ගැනීමට අතපසු කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

මෙවැනි ප්‍රශ්න නැවත නැවත පරීක්ෂා කරන ලද අතර සෑම වසරකම එකම වැරදි සිදු කරනු ලබයි.

(1) පසුගිය ප්‍රශ්න පත්‍ර පුහුණු වන්න - සෑම විභාගයකදීම සමාන ආකාරයේ ප්‍රශ්න නැවත නැවතත් පරීක්ෂා කරන ලදී. ඒ නිසා පසුගිය ප්‍රශ්න පත්‍ර පරිහරණය කරන්න.

(2) සාමාන්‍ය කොටස්වල පිරිවැය, නිදහස් කළ නොහැකි වරණීය කොටස්, නිදහස් කළ හැකි ණයකර සහ WACC සඳහා වන සූත්‍ර අධ්‍යයනය කරන්න.

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය විවිධ ආකාරයේ විචලනයන් ගණනය කිරීමේ හැකියාව මත පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

සෑහීමකට පත් නොවේ.

**පොදු දුර්වලතා:**

(1) ප්‍රශ්නයෙන් අසා ඇත්තේ මූලික විචලනයන් වුවද, අයදුම්කරුවන්ගෙන් බහුතරයක් විචලනයන් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(2) බොහොමයක් අයදුම්කරුවන්ට විචලනයන් ගණනය කිරීමේ සූත්‍ර පිළිබඳ දැනුමක් නොමැත.

(3) සමහර අයදුම්කරුවන් සූත්‍ර දැන සිටියද, විශේෂයෙන්ම සෘජු ශ්‍රම මිශ්‍රණ විචලනය සහ සෘජු ශ්‍රම ඵලදායිතා විචලනයන් සඳහා දත්ත නිවැරදිව ආදේශ කර නොමැත.

(4) සමහර අයදුම්කරුවන් විචලනයේ අවාසි හෝ වාසි ද යන්න සඳහන් කර නොතිබූ අතර ඇතැමුන් අවාසිදායක විචලනයන් වාසිදායක සහ වාසිදායක විචලනයන් අවාසිදායක ද දක්වා තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

මෙම ප්‍රශ්න නැවත නැවත පරීක්ෂා කරන ලද අතර සෑම වසරකම එකම වැරදි සිදු වේ.

(1) පසුගිය ප්‍රශ්න පත්‍ර පුහුණු වන්න. සෑම විටම පෙර වැඩ පෙන්වන්න.

(2) ප්‍රායෝගික යෙදුම් පුහුණු වීම සඳහා ස්ව-අධ්‍යයන කට්ටල පරිහරණය කරන්න .

(3) අයදුම්කරුවන් විවිධ අවස්ථා මත විචලනයන්ට අදාල සූත්‍ර පුහුණු විය යුතුය.

(4) විචලනයන් විශ්ලේෂණයේදී නිවැරදි යෙදුමන් සහිත සූත්‍ර ඉදිරිපත් කළ යුතුය.

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නය ශුද්ධ වර්තමාන අගය (NPV) ක්‍රමය යටතේ ව්‍යාපෘති ඇගැයීම පරීක්ෂා කරන ලදී. තවද, විවිධ ජීව කාලයන් යටතේ ධනාත්මක NPV දෙකක් සඳහා වාර්ෂික සාධක භාවිතා කිරීම පරීක්ෂා කරන ලදී. සමාගම් බදු ගණනය කිරීම සහ ගැලපීම NPV ගණනය යටතේ පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

සතුටුදායකයි.

**පොදු දුර්වලතා:**

(1) බොහෝ අයදුම්කරුවන් සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ විචලන පොදු කාර්ය ගණනය කිරීම සඳහා ඉල්ලුමේ වර්ධනය සලකා බලා නොමැත.

(2) බොහෝ අයදුම්කරුවන් බදු අගය වැරදි ලෙස ගණනය කර ඇත. සමහර අයදුම්කරුවන් බදු ගණනය කිරීමේදී ප්‍රාග්ධන දීමනා සැලකිල්ලට ගෙන නොමැත.

(3) සමහර අයදුම්කරුවන් ක්ෂයවීම් සහ ප්‍රාග්ධන දීමනා මුදල් ගලායාම් ලෙස වැරදියට සලකා තිබුණි.

(4) සමහර අයදුම්කරුවන් 20% වෙනුවට ප්‍රාග්ධන පිරිවැය ලෙස වෙනත් වැරදි අනුපාත යොදා ගෙන තිබුණි.

(5) බොහෝ අයදුම්කරුවන් වර්ධන නිර්ණායක යටතේ විකුණුම් ආදායම නිවැරදිව ගණනය කර ඇති අතර, නිවැරදිව ගණනය කිරීම් වලට අදාල කර තිබුණි.

(6) ආරම්භයේ දී ඉවත් කිරීමේ වටිනාකම වන රුපියල් මිලියන 4, වැරදි ලෙස නව යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයු කාලය අවසානයේ දී ගලා ඒමක් ලෙස පෙන්වා තිබුණි.

(7) අයදුම්කරුවන් විසින් එම ව්‍යාපෘති දෙකෙහි ආයු කාලය වෙනස් බැවින් එක් එක් ව්‍යාපෘතිය සඳහා වාර්ෂික ශුද්ධ වර්තමාන අගය (NPV) ගණනය කර ප්‍රශස්ත ව්‍යාපෘතිය තෝරාගෙන නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

(1) මීට පෙර පරීක්ෂා කර ඇති මේ හා සමාන ප්‍රශ්න පුහුණු වීමට අමතරව ස්ව-අධ්‍යයන කට්ටලය අධ්‍යයනය කළ යුතුය.

(2) ගණනය කිරීමේ දෝෂ අවම කිරීම.

(3) අයදුම්කරුවන් සාදන ලද ගණනය කිරීම්වලට අදාල සියලුම පෙර වැඩ පෙන්විය යුතුය.

## ප්‍රශ්න අංක 10

**A කොටස** මගින් පෙරසැරි ක්‍රියාවලි පිරිවැය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් සමානුපාතික ඒකක සහ පෙරසැරි ගිණුම් ප්‍රකාශනය සකස් කිරීම අපේක්ෂා කරන ලදී.

**B (a) කොටස** මගින් අදාළ පිරිවැය හඳුනා ගැනීම අපේක්ෂා කරන ලද අතර **B (b) කොටස** මගින් දායකත්වය සහ සමච්ඡේදන විකුණුම් වටිනාකම් ගණනය කිරීම පරීක්ෂා කරන ලදී.

**කාර්යසාධනය:**

සතුටුදායකයි

**පොදු දුර්වලතා:**

**<u>A කොටස</u>**

(1) සමහර අයදුම්කරුවන් සමානුපාතික පිරිවැය ගණනය කිරීම සඳහා ආරම්භක නොනිමි තොගයේ වටිනාකම සැලකිල්ලට ගෙන නොමැත.

(2) සමහර අයදුම්කරුවන් සමානුපාතික ඒකක ගණනය කිරීමේදී සාමාන්‍ය අපතය සැලකිල්ලට ගෙන නොමැත.

(3) සමහර අයදුම්කරුවන් ඒකක පිරිවැය ගණනය කිරීමේදී සාමාන්‍ය අපතයේ විකුණුම් අගය ඍජු ද්‍රව්‍ය පිරිවැයෙන් අඩු කිරීම සිදු කොට නොමැත.

**<u>B (a) කොටස</u>**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් බහුතරයකගේ පිළිතුරු පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. බොහෝ අයදුම්කරුවන් අදාළ පිරිවැය නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. තවද, සමහර අයදුම්කරුවන් වෙළඳපල පර්යේෂණ වියදම් ගිලුණු පිරිවැය ලෙස හඳුනාගෙන නොමැත.

**<u>B (b) කොටස</u>**

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ඒකාබද්ධ සමච්ඡේදන විකුණුම් අනුපාතය නිවැරදිව ගණනය කර නැත. එමනිසා, ඔවුන්ට නිවැරදි සමච්ඡේදන විකුණුම් ලක්ෂ්‍යය ගණනය කිරීමට නොහැකි විය.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

(1) මීට පෙර පරීක්ෂා කර ඇති මේ හා සමාන ප්‍රශ්න පුහුණු වීමට අමතරව ස්ව-අධ්‍යයන කට්ටලය අධ්‍යයනය කළ යුතුය.

(2) අයදුම්කරුවන් සාදන ලද ගණනය කිරීම්වලට අදාල සියලුම පෙර වැඩ පෙන්විය යුතුය.

-- - --